# දේශීය කෘෂිකර්මාන්තය තුළ ගොවීන්ගේ ආදායම් මට්ටම

**එම්. ආර්. එස්. සෝමරත්න**[1]


**සංක්ෂේපය**

දේශීය කෘෂිකර්මාන්තය තුළ ක්‍රියාකාරී සාමාජිකයන් වන්නේ, ගොවීන් ය. දේශීය කර්මාන්තය නඟා සිටුවීමෙහිලා මූලික දායකත්වය ලැබෙන්නේ, ගොවීන්ගෙනි. නමුත්, වර්තමාන දේශීය කෘෂිකර්මාන්තය තුළ ගොවීන්ට මෙම වගාවන් තුළින් ප්‍රමාණවත් ආදායමක් ලැබෙනවා ද යන්න ගැටලුවකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට කැප කිරීම් කරන ගොවියාට ප්‍රමාණවත් ආදායමක් ලැබෙනවා ද යන්න විමසා බැලීමයි. මේ සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් 50 දෙනෙකුගෙන් යුතු නියැදියක් තෝරා ගැනුණි. ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් අවශ්‍ය දත්ත ලබාගත් අතර සඟරා, මහ බැංකු වාර්තා ආදිය මගින් ද්විතික දත්ත ලබා ගැනීම සිදු විය. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක සංඛ්‍යානය මගින් සිදු විය. එහිදී අනාවරණය වූයේ, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් භෝග මිල ගණන් වසර පුරා දැඩි ලෙස උච්ඡාවචනය වූ බවයි. වසර අවසාන කාලයේ වූ කාලගුණික විපර්යාස හේතුවෙන් භෝග විනාශ වූ අතර එමගින් වෙළඳපොළ සැපයුම අඩු වී බොහොමයක් භෝග ගණන්වල මිල ගණන් ඉහළ මට්ටමක පැවති බවත් නමුත් එමගින් ගොවීන්ගේ ආදායමෙහි විශාල ප්‍රගතියක් සිදු නොවූ බව ද අනාවරණය විය. යල කන්නයේ භෝග සැපයුම විශාල වශයෙන් වැඩි වීම නිසා අතිරික්ත භෝග තොග ගණනින් වෙළඳපොළට මුදා හැරීම හේතු කොටගෙන මිල ගණන් විශාල වශයෙන් පහළ වැටුණ බව ද අනාවරණය විය. මේ නිසා වසර පුරාවටම ගොවියා බලාපොරොත්තු වන ආදායම නොලැබෙන බව නිගමනය වේ. මේ නිසා රජය අදාළ වගකිවයුත්තන්ගේ මූලිකත්වයෙන් වැවිලිකරුවන් දිරිගැන්වීම සඳහා ඔවුන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් ලබාදීම, සහනදායි මිල ගණන් යටතේ පොහොර හා බීජ ලබා දීම හා ඔවුන්ගේ ගැටලු විසඳීම සඳහා සුභවාදී ව මැදිහත් වීම කළයුතු වේ.


**මුඛ්‍ය පද :** දේශීය කෘෂිකර්මාන්තය, ගොවීන්, ආදායම

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ruvinisomarathna@gmail.com